# රතෙහි නැති වාස්තවිකත්වය

භාෂාව සම්බන්ධයෙන් පමණක් නොව අන් සියල්ලෙහි දී ම අප, එනම් සිංහල බෞද්ධ සංස්කෘතියක් තුළ ජීවත්වන්නවුන්, හා බටහිරයන් අතර ඇති ප්‍රධාන වෙනසක් නම් අප අපෙන් තොරව කිසිවක් පවතින බව නොපිළිගැනීමත්, බටහිරයන් තම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තුළ අපෙන් තොරව සියල්ල පවතින බව පිළිගැනීමත් ය. බටහිරයන් සාපේක්ෂතාවාදීන් වන අවස්ථාවක දී වුවත් එසේ කරන්නේ මිනිස් මනසින් තොරව පරමාර්ථ වශයෙන් නිරපේක්ෂ ව පවතින දෑ ඒ ඒ මිනිස් මනසට සාපේක්ෂව නිරීක්ෂණය වන්නේ, තේරුම් ගන්නේ කෙසේ ද යන තේරුමෙන් ය. එහෙත් සිංහල බෞද්ධයන්ට එය එසේ නොවේ. අපේ සාපේක්ෂතාවාදය, එනම් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය තුළ එවැනි පරමාර්ථ වශයෙන් නිරපේක්ෂ ව පවතින්නක් නැත. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අනවබෝධයෙන් අපි මනස ද ඇතුළු සියල්ල නිර්මාණය කරන්නෙමු. අප එසේ නිර්මාණය කරන්නේ ඒ ඒ සත්වයාට සාපේක්ෂව ය.  අපේ සහ බටහිරයන්ගේ සාපේක්ෂතා අතර ඇති මේ වෙනස තේරුම් ගැනීම භාෂාව පිළිබඳව ද අපේ  ප්‍රවාද නිර්මාණය කිරමේ දී වැදගත් වෙයි.

රතු පාට යන්න කීමේ දී යොදා ගැනෙන රතු යන වචනය හුදු සංකේතයක් නොවන බවත් මෙහි දී රතු පාට යන්න මාර්ග සංඥාවෙහි මෙන් නොව සෘජු සංජානනයක් බවත් අපි කීවෙමු. මාර්ග සංඥාවෙහි රතු යන්නට අප අර්ථකථනයක් දිය යුතු වෙයි. රතු පාටෙන් පැවසෙනුයේ, නැත්නම් හැඟෙනුයේ වාහනය නැවැත්විය යුතු බවත් මාර්ගයෙන් බාහිර තැනක දී  රතු පාට දුටුවහොත්, ඉන් අපට වාහන නැවැත්වීමක් නොහැඟෙවන බවත් අපි කීවෙමු. සෘජු සංජානන හා අප ලබාගන්නා නිගමන අතර වෙනස අප වටහා ගත යුතු ය. සොසූර් විද්වතාට මේ වෙනස පිළිබඳ අවබෝධයක් නොවී ය.

එහෙත් දැන් මෙවැනි ප්‍රශ්නයක් පැන නගී. මාර්ග සංඥාවෙහි රතු යන්න වාහන නැවැත්විය යුතු යැයි හඟවන්නේ යම් සංදර්භයක ය. වෙනත් තැනක රතු පාටෙන් වෙනත් දෙයක් අපට දැනෙයි. බැස යන හිරුගේ රතු පාට අපට දනවන්නේ අනතුරක් නොව චමත්කාරයකි. වෙනත් අයුරකින් කියන්නේ නම් රතු යන්නෙන් හැඟවෙන්න ඒ ඒ සන්දර්භය තුළ වෙනස් වෙයි. එලෙස ම වචන ද සන්දර්භය අනුව වෙනස් අදහස් අරුත් නොගන්නේ ද? රතු යන වචනය කෙසේ වෙතත් ඇතැම් වචන සන්දර්භය අනුව වෙනස් වෙයි. කවුරුත් දන්නා පරිදි වචනවලට ධ්වනිතාර්ථ වෙයි. අපි ඇතැම් දෑ ව්‍යංගයෙන් කියමු.

උපාසකම්මා සිල් ගනියි යන තැන්හි හා එයා හොඳ උපාසකම්මා යන තැන්හි උපාසකම්මා යන වචනයෙන් කියැවෙන්නේ, හැඟෙන්නේ එක ම දෙය නොවේ. එසේ නම් උපාසකම්මා යන වචනය ද ඒ ඒ සංදර්භය අනුව විවිධ දෑ හඟවන සංඥායකයක් නොවන්නේ ද? උපාසකම්මා යන්න සංකේතයක් පමණක් නොවන්නේ ද? මෙවැනි ප්‍රශ්නවලට අප දෙන පිළිතුර කුමක් ද? මෙහි දී අප තේරුම් ගතයුතු කරුණ නම් සෘජු සංජානන හා සෘජු සංජානන නොවන දෑ අතර ඇති වෙනස ය. රතු පාට යන්නට වචනයක් තිබුණත් නැතත්, අපට චිත්ත රූපයක් සමග රතු පට දිස් වෙයි. එනම් අපි ඒ චිත්ත රූපය සමග රතු යන සංකල්පය නිර්මාණය කරන්නෙමු. නැවත නැවතත් කිව යුතු වන්නේ රතු යන්න අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අනාවබෝධය නිසා අප විසින් නිර්මාණය කෙරෙන්නක් බව ය. රතු යන වචනය මේ චිත්ත රූපය සඳහා අප සකස් කර ගන්නා වූ, නිර්මාණය කර ගන්නා වූ ශබ්ද මාලාවකි. රතු යන වචනයට ඒ අරුතින් ප්‍රාථමික වචනයක් යැයි කිව හැකි ය. උපාසකම්මා යන්න එසේ ප්‍රාථමික වචනයක් නොවේ. උපාසකම්මා යන්නෙන් කියැවෙන සිල් ගත් කාන්තාවක් යන්න ගතහොත් සිල් ගත් යන්න ම සමාජය විසින්  නිර්මාණය කර ඇති දෙයක් බව පැහැදිලි වනු ඇත. සිල් යනු අපේ සිතෙහි නිසගයෙන් ම ඇති වෙන චිත්ත රූපයක් නොවේ. එයට යම් අර්ථකථනයක් වෙයි. ගැහැණියක හා පිරිමියකු අතර ඇති වෙනස වචනවලින් තොරව ම අවබෝධ කර ගත හැකි ය. එනම් ඒ වෙනස අපට නිර්මාණය කර ගත හැකි ය.

එහෙත් සිල් යන්න එසේ නොවේ. සිල් යන්න සමාජය විසින් අර්ථ දැක්වෙන්නකි. බටහිර රටක ඉපිද හැදුණු වැඩුණු අයකුට සිල් ගැනීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පහදා දිය යුතු ය. එසේ නොමැති ව සිල් ගත් උවැසියක දැකීමෙන් පමණක් එවැනි බටහිරයකුට සිල් පිළිබඳ චිත්ත රූපයක් ඇති නොවේ. උපාසකම්මා සිල් ගනියි යන තැන

© Prof. Nalin De Silva

උපාසකම්මා මෙන් ම එයා හොඳ උපාසකම්මා යන තැන උපාසකම්මා ද, සමාජය විසින් අර්ථකථනය කෙරෙන දෑ ය. මේ අර්ථකථන වචනය යොදා ගන්නා සන්දර්භය තුළ වෙනස් වන ආකාරයට සමාජය විසින් සකස් කෙරී ඇත. සන්දර්භය අනුව වෙනස් වන මාර්ග සංඥාවල රතු යන්න ද සමාජය විසින් අර්ථකථනය කෙරෙන බව සිහිපත් කර ගැනීම මෙහි දී වැදගත් වෙයි. සිල්, උපාකසම්මා වැනි වචනවලින් ප්‍රකාශ වන්නේ ඍජු සංජානන නොවේ. ඒවා ප්‍රාථමික වචන නොවේ. ප්‍රාථමික වචන නොවන දෑට සමාජ අර්ථකථන වෙයි. ඒවා සමාජය විසින් නිර්මාණය කෙරෙන්නේ වෙයි.

සමාජය විසින් නිර්මාණය කෙරෙන්නේ ය යන්න ද පැහැදිලි කළ යුතු ය. මෙයින් කියැවෙන්නේ මුළු මහත් සමාජය විසින් ම පොදුවේ ක්‍රියා කර යමක් නිර්මාණය කෙරෙන්නේ ය යන්න නොවේ. සමාජය එලෙස නිර්මාණ නොකරයි. නිර්මාණය කෙරෙන්නේ යම් පුද්ගලයකු අතිනි. යම් පුද්ගලයකු යම් නිර්මාණයක් කිරීමෙන් පසුව ඇතැම් විට සමාජය එය පිළිගන්නවා විය හැකි ය. එසේත් නැත්නම් ප්‍රතික්ෂෙප කරනවා විය හැකි ය. පළමු අවස්ථාවෙහි දී, එනම් යමක් සමාජය විසින් පිළිගැනෙන අවස්ථාවෙහි දී අපි එයට සමාජ නිර්මාණයක් යැයි කියමු.

වචනවල ධ්වනිය ආදිය ද සමාජය විසින් නිර්මාණය කෙරෙයි. එවැනි අවස්ථාවක ද සමාජ නිර්මාණය සිදු වන්නේ කලින් සඳහන් කර ඇති ආකාරයට ය. වචනවල ධ්වනිතාර්ථවලට පැවැත්මක් ඇත්තේ ඒ ඒ සමාජවල ය. ඓතිකාසික විකාශයෙහි ඒ ඒ වචනවලට දී ඇති අර්ථකථන ද වෙනස් වෙයි. කෝට්ටේ යුගයෙහි සුග යන්නෙන් කියැවී ඇත්තේ ටීකක්, සුළු ප්‍රමාණයක් වැනි අදහස් ය. කාන්තාවන්ගේ සිරුරුවල අලංකාරය ගැන කියමින් ඉග සුග ගත හැකි මිටින යනුවෙන් සඳහන් කර ඇත්තේ ටීකක් යන අරුතින්, සුග යන්නෙන් සිහින් යන්න හැඟවෙන ආකාරයට ය. එහෙත් අද සුග යනුවෙන් සඳහන් කරන්නේ හුගකට හෙවත් ගොඩකට ය. එවැනි වචනවල අර්ථ අප සමාජයෙන් ඉගෙන ගන්නවා පමණක් නොවේ. ඒ ඇතැම් වචනවලින් තොරව චිත්ත රූප ද නොවේ. රූපවාහිනිය යන වචනයෙන් තොර ව, එනම් සමාජය විසින් රූපවාහිනියට දී ඇති අර්ථකථනයෙන් තොර ව අප රූපවාහිනියක් ඉදිරිපස කෙතරම් වේලාවක් බලා සිටිය ද රූපවාහිනී යන චිත්ත රූපය ඇති නොවේ. අපට වැඩිම වුවහොත් ඇති වන්නේ පෙට්ටියක් වැනි අදහසක් හා චිත්ත රූපයකි.

අපි දැන් තවත් ප්‍රශ්නයකට මුහුණ පා සිටින්නෙමු. සමාජ අර්ථකථන සහිත වචනවල සාපේක්ෂ බවක් වෙයි. ඒවා සමාජයට සාපේක්ෂ වෙයි. එහි ධ්වනිතාර්ථ වෙයි. ඒ සමඟ එහි අර්ථය ද ඉතිහාසයෙහි වෙනස් වී ඇති බව අපට පෙනෙයි. ඒ වචන සම්බන්ධයෙන් චිත්ත රූප ද නිර්මාණය කෙරෙන්නේ සමාජයට සාපේක්ෂ ව ය. ඉන් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට හානියක් සිදු නොවේ. එසේ නම් සමාජ අර්ථකථන මත පරායත්ත නොවන, එනම් සමාජ අර්ථකථනවලින් තීරණය නොවන රතු වැනි පාට පිළිබඳ සංකල්පය මෙන් ම තවත් එවැනි දෑ ද, සමාජ අර්ථකථනයට හසු නොවන්නේ එහි ඊනියා වාස්තවිකත්වයක් ඇති බැවින් ද? කිසිසේත් ම නැත. මේ කරුණ ද අපට නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය තුළ අවබෝධ කරගත හැකි ය.

රතු පාට යන්නෙහි සමාජ අර්ථකථනයක් නොමැති යැයි පැවසෙන්නේ රතු යන පාට අපෙන් තොරව පවතින නිසා නොවේ. රතු පාට යන වචනය නොමැති වුව ද අපට රතු පාට යන චිත්ත රූපය නිර්මාණය කර ගත හැකිය යන අර්ථයෙන් එසේ කියැවෙයි. මෙහි දී කිවයුතු කරුණු දෙකක් වෙයි. එකක් නම් ඒ චිත්ත රූපය නිර්මාණය කෙරෙන්නේ නිවන් අවබෝධ කර නොගත්, අනිත්‍ය දුක්ඛ අනාත්ම පිළිබඳ අවබෝධයක් නැති තැනැත්තකු විසින් බව ය. දෙවැන්න චිත්ත රූප නිර්මාණය කිරීමේ දී ජෛවීය සාධකයේ ඇති වැදගත් කම ය. චිත්ත රූපය ඒ ඒ තැනැත්තාට එලෙස නිර්මාණාත්මක අර්ථයකින් සාපේක්ෂ වෙයි. රතු පාට මලක් හෝ වෙනත් රතු පාට යැයි කියන ද්‍රව්‍යයක් යම් තැනැත්තකු විසින් එලෙස නිර්මාණය කෙරුණ ද බළලකු බල්ලකු වැනි වෙනත් සතකු එහි දී කිනම් නිර්මාණයක් කර ගන්නේදැයි අපි නොදනිමු. සමහර සතුන්ට සමහර වර්ණ නොපෙනෙන්නේ යැයි ද තවත් සමහර සතුන්ට මිනිසුන්ට නොපෙනෙන වර්ණ පෙනෙන්නේයැයි ද කියනු ලැබේ. බටහිර භෞතික විද්‍යාවට අනුව විවිධ සත්තු විවිධ විද්‍යුත් චුම්බක තරංගවලට විවිධ ප්‍රතිචාර දක්වති. තරංගයේ සංඛ්‍යාතිය (ෆ්‍රීක්වන්සි) අනුව ඒ ඒ සතුන් එලෙස විවිධ ප්‍රතිචාර දක්වන්නේ බටහිර විද්‍යාව කියන ආකාරයට නම් ඒ ඒ සතුන්ගේ ජෛවීය ලක්ෂණ අනුව ය. සමාන ජෛවීය ලක්ෂණ සහිත සත්තු සමස්තයක් ලෙස ගත්කල එවැනි අවස්ථාවල සමාන ව ප්‍රතිචාර දක්වති.

© Prof. Nalin De Silva

එහෙත් ඇතැම් විටෙක වර්ණ අන්ධතාවයෙන් පෙළෙන්නෝ ද වෙති. බටහිර විද්‍යාවට අනුව එයට ද හේතුව එවැනි පුද්ගලයන්ගේ ජෛවීය ව ඇතිවන යම් යම් ආබාධ ය. මේ ජෛවීය ආබාධ සාංසාරික ව එන කර්ම විපාකයක් විය හැකි ය. කෙසේ වෙතත් මෙහි දී පැහැදිලි විය යුතු කරුණ නම් චිත්ත රූප ද ඇතුළු දැනුම නිර්මාණය කිරීමේ දී මනස ඉන්ද්‍රිය පද්ධතිය හා සංස්කෘතිය ක්‍රියා කරන ආකාරය ය. මනසක් නැත්නම්, එනම් නැති මනසක් ඇති බව නොසිතන්නේ නම් චිත්ත රූප නැත. මනසේ ස්වභාවය අනුව ද චිත්ත රූප වෙනස් වෙයි. එමෙන් ම ඉන්ද්‍රිය පද්ධතිය ජෛවීය ව පිහිටා තිබෙන ආකාරය අනුව ද චිත්ත රූප වෙනස් වෙයි. බල්ලන්ට දැනෙන සුවඳ මිනිසුන්ට නොදැනෙයි. අපට පෙනෙන වර්ණ ඇතැම් සතුනට නොපෙනෙයි. අවසානයේ දී මෙලෙස සංස්කෘතියට සාපේක්ෂ නොවී ඇතිවන චිත්ත රූපයකට පවා නමක් දෙන්නේ සංස්කෘතිය විසිනි. ඇතැම් සංස්කෘතීන් හි ඒ ඒ පාටට නම් නැත. සුදු යන වර්ණයෙහි විවිධ ප්‍රභේද සඳහා ඉංගිරිසියෙහි ඇති වචන සිංහලයෙහි නැත. වී හා සහල් සම්බන්ධයෙන් කතා කිරීමේ දී සිංහලයන් යොදා ගන්නා වචනවලට සමාන අරුත් ඇති වචන ඉංගිරිසියෙහි නැත. රතු චිත්ත රූපය සඳහා රතු යන නම තැබී ඇත්තේ සමාජය, එනම් සංස්කෘතිය විසිනි. දැනුම මනසට, ඉන්ද්‍රිය පද්ධතියට හා සංස්කෘතියට සාපේක්ෂ වන්නේ ඒ ආකාරයට ය. රතු යන පාට අදාළ රතු යන නම නොමැතිව චිත්ත රූපයක් ලෙස ඇතිවුව ද, ඒ චිත්ත රූපය සංස්කෘතියට සාපේක්ෂ නොවුව ද, චිත්ත රූපය මනසට හා ඉන්ද්‍රිය පද්ධතියට සාපේක්ෂ වෙයි.

ජෛවීය ව සමාන සතුන් ඒ ඒ අවස්ථාවෙහි සමාන ලෙස ප්‍රතිචාර දැක්වීමෙන් වාස්තවිකත්වයක් ඇති නොවේ. මිනිසුන් වාස්තවිකත්වයක් ඇතැයි යනුවෙන් සිතීමට පුරුදු වී ඇත්තේ මේ සමාන ප්‍රතිචාර දැක්වීම ද හේතුකොටගෙන ය. අප සියල්ලන්ට ම පාහේ රතු යැයි නම් කළ හැකි පාටක් මනසට ගෝචර වන බැවින් රතු යන්න අපෙන් තොරව පවතින්නේ යැයි සිතීමට මිනිස්සු පුරුදු වී සිටිති. එහෙත් වර්ණ අන්ධභාවයෙන් පෙළෙන්නන්ට එවැනි පාටක් නැත. එමෙන් ම බොහෝ සතුන්ට ද එවැනි පාටක් නැත. එසේ නම් වාස්තවිකත්වය ඇත්තේ කොහේ ද? තමන් වැනි මිනිසුන් කොටසක් පමණක් මත පදනම් වී අනෙක් මිනිසුන් හා සතුන් අමතක කර නිගමනවලට පැමිණීම ඒනියා ප්‍රජාතන්ත්‍රවාදයට නම් එකඟ විය හැකි ය. ග්‍රීකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය වහල් හිමියන්ට පමණක් සීමා විය. ග්‍රීකයෝ ඒනියා ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීමේ දී වහලුන්ගේ සිතැඟි නොසළකා හැරියෝ ය. වාස්තවිකත්වය ගැන කතා කරන්නෝ ද අනෙක් ප්‍රාණීන් නොසළකා හරිති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva